ලිංගික අපරාධයක් හෝ ලිංගික අපයෝජනයක් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී දූෂණය හෝ කෙළෙසීම වැනි වදන් යොදා නොගන්නා ලෙසට ජනමාධ්‍යවේදීන්ව දිරිමත් කෙරේ. මන්දයත්, දූෂණය/කෙළෙසීම යන වදන් ඔස්සේ එම තැනැත්තියව හෝ තැනැත්තාව අපවිත්‍ර වූ බවක්, කිළිටි වූ බවක් ගම්‍ය කෙරෙනා අතර, ඒ ඔස්සේ සමාජය තුළ ඔවුන්ව වක්‍රාකාරයෙන් කොන් කිරීමකට ලක් විය හැකි බැවිනි. එනිසා, මෙවන් ආකාරයක වාර්තාකරණයක් සඳහා ලිංගික අපරාධය හෝ ලිංගික අපයෝජනය යන වදන් වඩාත් යෝග්‍ය වේ.